**ශීර්ෂය 413 - මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 413 - මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කරඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

**(අ)** **වර්ගීකරණ දෝෂ**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ගමන් වියදම් 1101 වැය විෂය යටතේ ගිණුම්ගත කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණු රු.48,000 ක දේශීය ගමන් වියදම් 413-1-1-1409 වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි. | නවාතැන් පහසුකම් සඳහා රු.48,000 ක් වියදම් වූ බැවින් 413-1-1-1409 (වෙනත් සේවා) වැය විෂය යටතේ ගිණුම්ගත කර ඇත. | ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |

**(ආ)** **දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජුනි 06 දින රාජ්‍ය අමාත්‍යාංශය කටයුතු අවසන් කරන අවස්ථාවේ පිළියෙල කර ඉදිරිපත් කර තිබුණු මූල්‍ය තත්ත්ව විස්තරය අනුව දේපල, පිරියත හා උපකරණවල වටිනාකම රු.22,336,274 ක් වී තිබුණි. විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල 2021 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණවල වටිනාකමක් දක්වා නොතිබුණි. එම වත්කම් වෙනත් | 2021.06.06 දිනෙන් පසු 413 වැය ශීර්ෂය යටතේ වූ මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශයේ විෂය පථය යටතට පවරන ලදී. 2021.06.06 දින සිට 2021.12.31 දින දක්වා 413 වැය ශීර්ෂය යටතේම එම අමාත්‍යාංශයට අදාළ වියදම් දරා 2021.12.31 දිනට එම වැය ශීර්ෂයට අදාළ ගිණුම් අවසන් කර එදිනට අවසන් ගිණුම් සකස් කර ඉදිරිපත් | දේපල පිරියත හා උපකරණ නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම |

| | | |
|---|---|---|
| ආයතනයකට පවරා තිබුණු බව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. | කර ඇත. 2021.06.06 දිනට කිසිදු ගිණුමක් විගණනය වෙත ඉදිරිපත් කර නොමැති අතර, එදිනට පැවැති තත්ත්වය වාර්තා කර ගැනීමක් පමණක් රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් වෙතින් ලබා ගන්නා ලදී. | |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රාජකාරී විදේශ ගමන් වියදම් සඳහා රු.6,976,244 ක් වැය කර තිබුණු අතර එම වියදම් සඳහා අදාළ ලිපි ගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය 2021.10.06 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ අයත් නිවේදනයට අනුව විසුරුවා හරින ලදී. ඒ අවස්ථාවේදී එම අමාත්‍යාංශයට අදාළ සියලුම අංශවල ලිපිගොනු එකට බැඳ භාරදුන් අතර ඔබ විසින් ඉල්ලා සිටි, විගණනයට අවශ්‍ය ගොනු ක්ෂණිකව සොයා ගැනීම අපහසු වූ බැවින් ඒ සඳහා අමතර කාලයක් ගත කිරීමට සිදුවිය. එබැවින් ඔබ විසින් එම ගොනු ඉල්ලුම් කළ දිනය වන විට එම ගොනු විගණනයට ඉදිරිපත් කළ නොහැකි විය. | ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීම සඳහා අදාළ තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වීම. |
| (ii) | දේශීය ගමන් වියදම් වශයෙන් රු.1,599.250 ක් වැය කර තිබුණු අතර ඒ සඳහා පොදු 172 ආකෘතිය ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ගමන් වියදම් වශයෙන් ගෙවා තිබුණු රු.1,599,250 ක ගෙවීම්වලට අදාළ පොදු 177 වවුචර්පත් වැටුප් වවුචර්පත් ගොනුවට ඇතුළත් කර නොමැති අතර වෙනම ගොනුවක ගොනුගත කර ඇත. එම වවුචර්පත් විගණනය සඳහා අවශ්‍ය වන්නේ නම් ඔබ වෙත ඉදිරිපත් කළ හැක. | දේශීය ගමන් වියදම් ගෙවීම සඳහා පොදු 172 ආකෘතිය ප්‍රකාරව ගෙවීම් වවුචර් ඉදිරිපත් කළ යුතු වීම . |

**(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (i) | 1993 දෙසැම්බර් 31 දිනැති අංක පී.පී.ඒ/6/1/1 දරන හා 2010 ජූලි 09 දිනැති අංක සීඒ/1/1/16/1 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරින් විසින් රු.3,955,281 ක් වැය කර රුසියානු සංචාරයට සහභාගී වී තිබුණත්, සංචාරය පිළිබඳ වාර්තාව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ බලධාරීන් වෙත විධිමත් පරිදි ලබා දී නොතිබුණි | ගරු මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා විසින් 1993 දෙසැම්බර් 31 දිනැති පී.පී.ඒ/6/1/1 හා 2010 ජූලි 09 දිනැති සීඒ/1/1/16/1 යන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව අදාළ වාර්තාව සෘජුවම ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බව ගරු මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් විසින් දැනුවත් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 5.3 වගන්තිය | ඉක්මනින් රාජකාරී කටයුත්තක් ඉටු කිරීම සඳහා අභ්‍යන්තර ගුවන් සේවයේ ගමන් කිරීමට අවශ්‍යතාවයට තුඩු දෙන විශේෂ හේතු සඳහන් කර අනුමැතියක් ලබා ගත යුතුව තිබුණි. එවැනි විශේෂ හේතු කිසිවක් වාර්තාගත කිරීමකින් තොරව රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් තිදෙනෙකු අභ්‍යන්තර ගුවන් සේවයේ ගමන් කිරීම වෙනුවෙන් රු.100,050 ක් වැය කර තිබුණි. | ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 5.3 වගන්තියට අනුව මෙම යාපනයේ සංචාරය රජයේ විශේෂ රාජකාරි කටයුත්තක් විය. ඒ සඳහා විවිධ ක්ෂේත්‍රවල නිලධාරීන් 15 දෙනෙකු සමඟ ගරු රාජ්‍ය ඇමතිතුමා 2021.02.27 දින සිට 2021.03.01යන දින දක්වා යාපනය ප්‍රදේශයේ සංචාරය කරන ලදී. එහිදි යාපනය ප්‍රදේශයේ කර්මාන්තකරුවන් , කෘෂිකර්මය ඇතුළු | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අපනයන ව්‍යාපාරිකයින් හා එම ප්‍රදේශයේ බැංකුකරුවන් සමඟ සාකච්ඡා මාලාවක් පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබුණි. එබැවින් ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 5.3 වගන්තියට අනුව රාජකාරී කටයුත්තක් සඳහා අභ්‍යන්තර ගුවන් සේවය භාවිතා කිරීමට හැකියාව ඇත. | |
| (iii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 හා 3.3 ඡේද | රාජ්‍ය අමාත්‍යාංශය භාවිතයට ගෙන තිබූ වාහන සම්බන්ධයෙන් සිදු කළ යුතු ඉන්ධන පරීක්ෂා කිරීම් සම්බන්ධයෙන් වූ සටහන් පවත්වා නොතිබුණි. | මුදල් අමාත්‍යාංශය සහ මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙත තාවකාලිකව ලබාදී ඇති වාහන සම්බන්ධව ඉන්ධන පරීක්ෂණයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **(අ) ප්‍රතිපාදන නිෂ්ඵල වීම** | | |
| වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.1,650,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනය මුළුමණින්ම ඉතිරි කර තිබුණි. | 2021.10.06 දිනැති අංක 2248/35 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය හා ඒ යටතේ වන කාර්යයන් හා කර්තව්‍යයන්, සුවිශේෂී ප්‍රමුඛතා, අදාළ ආයතනික හා නෛතික රාමුව ඉවත් | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | කර මුදල් අමාත්‍යාංශ ශීර්ෂය යටතට පවරා දීම හේතුවෙන් අපේක්ෂිත වියදම් දැරීමට නොහැකි වීම හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාලයීය කටයුතු සාමාන්‍ය පරිදි සිදු නොවීම යන හේතූන් මත ප්‍රතිපාදන ඉතිරි වීම සිදු විය. | |

**(ආ) අධිප්‍රතිපාදන සැලසීම**

| | | |
|---|---|---|
| වැය විෂයයන් 28 ක් සඳහා එකතුව රු..67,071,025 ක අධිප්‍රතිපාදන සලසා ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.31,279,144 ක උපයෝජනයක් පමණක් කර තිබුණි. ඒ අනුව එකතුව රු.35,791,881 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එම ඉතිරිය එක්එක් වැය විෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 15 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | 2021.10.06 දිනැති අංක 2248/35 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය ශීර්ෂය හා ඒ යටතේ වන කාර්යයන් හා කර්තව්‍යයන්, සුවිශේෂී ප්‍රමුඛතා, අදාළ ආයතනික හා නෛතික රාමුව ඉවත් කර මුදල් අමාත්‍යාංශ ශීර්ෂය යටතට පවරා දීම හේතුවෙන් අපේක්ෂිත වියදම් දැරීමට නොහැකි වීම හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාලයීය කටයුතු සාමාන්‍ය පරිදි සිදු නොවීම යන හේතූන් මත ප්‍රතිපාදන ඉතිරි වීම සිදු විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත. අවශ්‍ය නම් විගණනය සඳහා පිටපතක් ඉදිරිපත් කළ හැක. | නියමිත කාලය තුළ සැලසුම් පිළියෙල කළ යුතු වීම. |

**3.2 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 09 දිනැති අංක 2187/27 අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කළ නිවේදනයක් මඟින් ශ්‍රී ලංකා ආර්ථිකය ඉහළ තලයකට නැංවීම අරමුණු කරගත් සුවිශේෂී කාර්යයන්, කර්තව්‍යයන් හා සුවිශේෂී ප්‍රමුඛතා 20 ක් මුදුන්පත් කර ගැනීමේ අභිලාශයෙන් රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවා තිබුණි. මාස 13 ක කාලපරිච්ඡේදයකට පසුව 2021 සැප්තැම්බර් 30 දින රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු අවසන් කරන විට රජයේ අරමුදල්වලින් රු.74,588,694 ක් වැය කර තිබුණි. එහෙත් අමාත්‍යාංශය පිහිටුවීමේ අරමුණු, කාර්යයන්, කර්තව්‍යයන් හා සුවිශේෂී ප්‍රමුඛතාවන් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වාර්තා වී නොතිබුණි. | 2021.10.06 දිනැති අංක 2248/35 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වූ බැවින් 2021 ඔක්තෝබර් මාසයේ මැද භාගය වන විට ආයතනයේ සියලු කටයුතු අවසන් කර සියලු නිලධාරීන් හා සේවකයන්ද වෙනත් ආයතන වෙත අනුයුක්ත කළ බැවින් 2021 වර්ෂය අවසානයේ ප්‍රගති සමාලෝචනය කිරීමට අවස්ථාවක් නොතිබුණි. | වැය කර ඇති වියදම්වල ප්‍රගතිය වාර්තා කළ යුතු වීම |

**3.3 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ රු.10,900 ක් වටිනාකම වූ Hard Disk එකක් රාජ්‍ය අමාත්‍ය කාර්යාලයෙහි තාවකාලික කාර්ය මණ්ඩලයට අයත් නිලධාරියෙකු විසින් රැගෙන ගොස් තිබූ අතර රාජ්‍ය අමාත්‍යාංශ කටයුතු අවසන් කරන අවස්ථාවේදී එය නැවත භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබූ එම Hard Disk එක නැවත භාරදෙන ලෙස ඉල්ලා අංක: SMMCM/FIN /03/01/02 හා 2021.09.24 දිනැතිව ලිපියක් යවා ඇති අතර, එම ලිපියෙහි කාර්යාල පිටපත Issuing of inventory items ගොනුවෙහි අමුණා ඇති බව දන්වමි. | ඉන්වෙන්ට්‍රි පාලනය මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කළ යුතු වීම. |

**4 කළමනාකරණ දුර්වලතා**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ඔක්තෝබර් 06 දිනැති අංක 2248/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කළ නිවේදනයක් අනුව මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශ කටයුතු අවසන් කර තිබුණත්, ඒ වන විට රාජ්‍ය අමාත්‍යවරයා හා එම පෞද්ගලික කාර්යමණ්ඩලය විසින් පරිහරණය කළ වාහන 08 ක් ආපසු භාර දී නොතිබුණි. | මුදල් අමාත්‍යාංශය විසින් අමාත්‍යවරයා හා කාර්ය මණ්ඩලයට නිල වාහනය ලබා දී ඇත. එබැවින්, මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු අවසන් කිරීමේදී එම නිලධාරීන් භාවිතා කරන ලද නිල වාහනය අලුත් පත්වීම ලබා ගත් ආයතනයේ රාජකාරි සඳහා භාවිතා කිරීමට මුදල් අමාත්‍යාංශය විසින් අවසර ලබා දී ඇත. | අමාත්‍යාංශ කටයුතු අවසන් කිරීමේදී වත්කම් නිසි පරිදි නිලධාරීන්ගෙන් නැවත පවරා ගත යුතු වීම |
| (ආ) | රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා 2021 අප්‍රේල් 07 දින සිට විශ්‍රාම ලබා සිටි අතර ලේකම්වරයා භාවිතා කළ සුඛෝපභෝගී Toyota Prado Jeep රථය රාජ්‍ය අමාත්‍යවරයාගේ මහජන සම්බන්ධීකරණ ලේකම් වෙත ලබාදීමට කටයුතු කර තිබුණි. රාජ්‍ය අමාත්‍යාංශ කටයුතු අවසන් කිරීමේදී එම නිලධාරියාගේ තනතුර අහෝසි වී තිබුණද 2022 අප්‍රේල් 21 දින වන විටත් එම වාහනය නැවත භාරදීමට කටයුතු කර නොතිබුණි. | මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි කිරීමත් සමඟ KJ – 3960 අංක දරන ජීප් රථය රාජ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය වෙත තාවකාලිකව භාර දී ඇති එම මොටර් රථය 2022.04.22 දින නැවත මුදල් අමාත්‍යාංශය වෙත භාරදී ඇත. | අමාත්‍යාංශ කටයුතු අවසන් කිරීමේදී වත්කම් නිසි පරිදි නිලධාරීන්ගෙන් නැවත පවරා ගත යුතු වීම |